00089

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණ වැඩ සටහන**
**අවසාන පරීක්ෂණය 2009**
**මෙහෙයුම් කළමනාකරණයට හැඳින්වීමක් - MCC 1105**
**කාලය පැය දෙකයි (02)**

---

**දිනය : 2009.12.12** | **වේලාව : පෙ. ව. 10.00 – මධ්‍යාහ්න 12.00**

---

ඕනෑම ප්‍රශ්න හතර (04) කට පිළිතුරු සපයන්න.
වැඩ සටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

1. (අ) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ දැනුම දායක විය හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න. ( ලකුණු 12 )

   (ආ) ඔබට සමීප නිෂ්පාදනයක මෙහෙයුම් පද්ධතිය විස්තර කරන්න. ඔබේ පිළිතුරට ආධාර වනු පිණිස සුදුසු රූප සටහන් යොදා ගන්න. ( ලකුණු 13 )

2. (අ) අලෙවිකරණය හා සම්බන්ධ තොරතුරු නිෂ්පාදකයන්ගේ විවිධ තීරණ ගැනීම් සඳහා යොදා ගැනේ.
   නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය වන්නේ කුමන ආකාරයේ අලෙවිකරණ තොරතුරු දැයි හඳුන්වා දී ඒවා පැහැදිලි කරන්න. ( ලකුණු 12 )

   (ආ) ඔබ කැමති ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් තෝරා ගෙන ඔබ එය නිර්මාණකරණය කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න. ( ලකුණු 13 )

3. (අ) ක්‍රියාවලි සැලසුම්කරණයේ අධියරයන් සුදුසු උදාහරණ යොදා ගෙන පැහැදිලි කරන්න. ( ලකුණු 12 )

   (ආ) කම්හල් බිම් සැකැස්ම නිෂ්පාදන කාර්යයේ විවිධ පැති කෙරෙහි බලපායි. මනා කම්හල් බිම් සැලැස්මකින් අපේක්ෂා කළ හැකි වාසි සාකච්ඡා කරන්න. ( ලකුණු 13 )

4. (අ) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන් සඳහා බලපාන ප්‍රධාන කරුණුවලින් එකක් වනුයේ ඵලදායිතාවයයි. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන ආයතනවල ඵලදායිතාව සඳහා බලපාන සාධක පැහැදිලි කරන්න. ( ලකුණු 10 )

(ආ) සුරේන් ප්‍රාදේශීය වෙළඳපොළ සඳහා කමිස නිපදවයි. කමිසයක් නිපදවීම සඳහා පිරිවැය තොරතුරු පහත දක්වා තිබේ. එක් කමිසයක් සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කරන්න.

රෙදි භාවිතය - එකක් රු.150/- බැගින් වූ මීටර් 2 ක්
ඇඳුම් මසන්නන් යෙදවීම - ඇඳුම් මසන්නන් දෙදෙනෙකු පැය 3.5 බැගින් යෙද වේ. පැයක් වැඩ කිරීම සඳහා රු.35/- ක වේතනයක් ගෙවිය යුතුය.

කමිසයක් සඳහා වැයවන වෙනත් පිරිවැය
විදුලිය සඳහා පිරිවැය රු.40/-
අවශේෂ ද්‍රව්‍ය සහ වෙනත් නිෂ්පාදන පිරිවැය රු.32/-
( ලකුණු 12 )

(ඉ) සුරේන් 4 (ආ) හි ඇස්තමේන්තු කළ නිෂ්පාදන පිරිවැය සඳහා 40% ක ලාභ ආන්තිකයක් එකතු කරයි නම්, කමිසයක විකුණුම් මිල කීයද? ( ලකුණු 13 )

5. පහත ඒවායින් ඕනෑම පහක් (05) සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

(අ) මෙහෙයුම් කළමනාකරණයේ පරිණාමය
(ආ) නිෂ්පාදන ඉංජිනේරුකරණය
(ඇ) වැඩ මැනීම
(ඈ) නිෂ්පාදන සැළසුම්කරණය
(ඉ) තොග පාලනය
(ඊ) නිෂ්පාදකයන් සඳහා අන්තර්ජාලයේ භාවිතයන්' ( ලකුණු 25 )

- හිමිකම් ඇවිරිණි -